# රජයේ ඉඩම් සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය හා ගැටුම් නිර්මාණය

**එම්.ජී.චාමර සම්පත් මධුසංඛ නන්දසේන**[1]

**එම්.කේ. නදීකා දමයන්ති**[2]

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**සංක්ෂේපය**

බ්‍රිතාන්‍යයන් වැවිලි ආර්ථිකයක් හඳුන්වාදීමේදී එයට අවශ්‍ය ඉඩම් ලබාගැනීමට නව ආඥා පනත් සම්මත කර ක්‍රියාත්මක කිරීම තුළ ඉඩම් අහිමි ස්වදේශික පංතියක් බිහිවීම සිදුවිය. කෙසේ වුව ද, 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත නීතිගත වීම කිරීම තුළින් ඉඩම් අහිමි ජනතාවට ඉඩම් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ආඥා පනත වර්තමානය දක්වාම ඉඩම් සම්බන්ධයෙන් පවතින වැදගත් නෛතික ලේඛනයයි. ගොවිජනපද ව්‍යාපාරය හරහා ඉඩම් නොමැති පුද්ගලයන්ට ඉඩම් ලබාදීම බහුලව සිදුකරනුයේ මෙම නීතිය උපයෝගි කර ගනිමිනි. එහෙයින් මෙම අධ්‍යයනය තුළ ඉඩම් සංවර්ධන ආඥා පනත සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකර ඇත. වර්තමානයේ රජයේ ඉඩම් සම්බන්ධයෙන් මතුවන ගැටලු ප්‍රමාණය වැඩිවීමට රජයේ ඉඩම් ප්‍රතිපත්තිය බලපාන්නේද? යන්න විමර්ශනය කිරීම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන දෙයාකාරයේම දත්ත උපයෝගී කර ගනිමින් මෙම අධ්‍යයනය සිදුකරන ලදී. අධ්‍යයන ප්‍රදේශය වශයෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහවැලි ව්‍යාපාරයට අයත් මොරගහකන්ද කලාපයේ බකමූණ නේවාසික කළමනාකාර කොට්ඨාසයේ (ගශේයාය) අංක 14 සොමියල් ග්‍රාම නිලධාරී වසම අහඹු ලෙස තෝරා ගැනිණි. එහිදී ගොවි සංවිධාන නියෝජිතයින් සමඟ සාකච්ඡා කොට ඉඩම් සම්බන්ධයෙන් ගැටලු මතුවී ඇති ඉඩම් ලාභීන් වන කොළනි ජනපදිකයින් 50 නියැදිය වශයෙන් තෝරා ගැනිණි. ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ ක්‍රමවේදය වශයෙන් ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද භාවිතා කළ අතර ඉඩම් ලාභීන් ලබාදුන් තොරතුරුවල නිරවද්‍යතාව සහතික කර ගැනීම සඳහා මූලික තොරතුරු සපයන්නන් වශයෙන් ගොවි සංවිධාන නියෝජිතයන් සම්මුඛ සාකච්ඡා සිදුකරන ලදී. එමෙන්ම මහවැලි ව්‍යාපාරයේ ඉඩම් නිලධාරීන් සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා මගින්ද තොරතුරු සපයා ගැනිණි. ද්විතියික දත්ත සහ තොරතුරු මේ සම්බන්ධයෙන් සිදුකර ඇති පර්යේෂණ වාර්තා, මහවැලි ව්‍යාපාරයේ ප්‍රකාශන සහ අණපනත් ආදිය තුළින් සම්පාදනය කරගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේදී ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධික්‍රම ඔස්සේ ද, ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේද සිදුකරන ලදී. අධ්‍යයනය තුළින් තහවුරු වූයේ රජයේ ඉඩම් ප්‍රතිපත්තියේ තුන්වැනි උපලේඛනය සහ අවම බෙදුම් සීමාව සම්බන්ධයෙන් පවතින නීතිමය කරුණු වර්තමානයේ ඉඩම් ගැටලු නිර්මාණය සඳහා බහුලව හේතුවන බවයි. මෙම කරුණ ප්‍රතිචාරීන්ගෙන් 78 % සනාථ කර ඇත. එකී ගැටලු අවම කිරීම සඳහා රජයේ ඉඩම් ප්‍රතිපත්තිය වර්තමාන සමාජ, ආර්ථික තත්ත්වයට අනුව වෙනස් විය යුතු බව මෙම පර්යේෂණයේ ප්‍රධාන යෝජනාව වේ.

**මුඛ්‍යපද ඃ රජයේ ඉඩම්, රාජ්‍ය ප්‍රතිපත්තිය, ඉඩම් ගැටලු, මහවැලි ව්‍යාපාරය, ඉඩම් සංවර්ධන ආඥා පනත**

---

*1. දේශපාලන විද්‍යාව, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*